IBO IB DIPLOMA PROGRAMME
PROGRAMME DU DIPLÔME DU BI
PROGRAMA DEL DIPLOMA DEL BI

M03/149/S(1)

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 1**
**CINGALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 1**
**CINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 1**

Monday 19 may 2003 (morning)
Lundi 19 mai 2003 (matin)
Lunes 19 de mayo de 2003 (manana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a commentary on one passage only. It is not compulsory for you to respond directly to the guiding questions provided. However, you may use them if you wish.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- Ne pas ouvrir cette épreuve avant d'y être autorisé.
- Rédiger un commentaire sur un seul des passages. Le commentaire ne doit pas nécessairement répondre aux questions d'orientation fournies. Vous pouvez toutefois les utiliser si vous le désirez.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un comentario sobre un solo fragmento. No es obligatorio responder directamente a las preguntas que se ofrecen a modo de guía. Sin embargo, puede usarlas si lo desea.

# මලක මහිම

සතර දිගන්තෙන් බඹරු පිරෙන්නේ
සිතැ'ඟි ලෙසින් රොන් රස ඇද බොන්නේ
ඉතිරි අඩෙන් මීවද පුරවන්නේ
මලෙහි අගය ගස වැල නැත දන්නේ

පියපත් සල සල පියඹා වත්තට
සමනල බිඟුකැල මල සිඹ ගන්නට
පිපුනත් පොකුරු ගැහී එක ඉත්තට
සුවඳ දැනෙනව ද දළු කොළ රොත්තට

දෙනුවන් ඇතියන් රුව දැක බැඳුනේ
නෙලමින් සකසා රඳව යි බඳුනේ
විකසිත වී ලෙල දෙන මුදුපවනේ
මලෙකැති ලස්සන නටුවට නොපෙනේ

වැටහි ඇති රස දැනිලා රුසිරු
පොර කතී මකරන්දෙට වන බඹරු
දකිතත් ලිය ගොමු කුසුමෙන් ඉතුරු
නොපතතී මල්වල රොන් සුණු දෙබරු

පොකුණු ජලේ ලොව එළිය දකින්නේ
එහි ගැවසී එහිම ය මිය යන්නේ
නටු මල මඩ ගොඩ මත මැද ඉන්නේ
පියුමට පිරියක් නැත මැඩියන්නේ

සුනිල් තටාකයෙ දුර හැර පාළු
වරල් සලා පිහිනන හැඩ පාළු
ළඟින් යටින් ඇදිලා යන මාළු
කුසුම් කතුන් සමඟින් නැත යාළු

ගෙන දෙයි පිලි දෙන පිණිසද ජීවය
මුමුණයි මත් ලෙස නහ නහ රාවය
හැම කල්හිම පිපි නිලුපුල් භාවය
දිය නොදනී එහි සුන්දරතාවය

බොජුන් මේස මත හැඩට තබන්නේ
ලියන් වරල ඔප දැමුමට ගන්නේ
රුවන් පුද අසුන් පිට පුද දෙන්නේ
එවන් මලෙහි මහිමය නැත දන්නේ

- මෙම පද්‍ය පන්තියෙහි ප්‍රධාන තේමාව කුමක් ද?
- හැඟීම් ජනනය කිරීම සඳහා කවියා භාවිත කරන රචනොපක්‍රම පිරික්සන්න.
- මෙම පද්‍ය පන්තියෙහි ප්‍රතිවිරුද්ධ සංකල්ප භාවිත කොට ඇති ආකාරය පිරික්සන්න.
- කවියා මල කෙරෙහි දක්වන ආකල්පය හා එය ප්‍රකට වන අන්දම පරීක්‍ෂා කරන්න.

# වහල්ලු

හඳයා උපාලිස් ගේ කකුල ලෙව කෑවේ ය. නින්දෙන් අවදිවුණු ඔහු පළමුව තම දෙපා දෙස බැලුවේ කෝපයෙනි. ඌ යළිත් ඔහුගේ කකුල ලෙව කෑවේ ය. කඳුලෙන් තෙත් වුණු මහල්ලකුගේ දෙඇස සිහි කරවන උගේ දෙඇසත්, තමා දෙසට හරවන ලද සැලෙන මස්පිඬු සහිත හොම්බත් දුටු උපාලිස්ගේ කෝපය මැඩගෙන නගින්නේ කාරුණික හැඟීමකි.

"වරෙන් වරෙන් මෙහාට වරෙන් ......" යි ඔහු සෙමින් කිවේ ය.

හඳයා තම ඉස්සරහ ගාත් දෙකින් එකක් සෙමින් ගෙපිළෙහි තැබුවේ ය; අනතුරුව අනික් ගාතය ද උස්සා ගෙපිළෙහි තැබුවේ ය. ඌ අනික් පස්සා ගාතය ද තබා ගෙපිළට නැඟුණේ කන්දකට නගින්නකු මෙන් මහන්සිවීමෙනි.

උපාලිස් තමා වෙතට ළංවූ ගොන් මාල්ලාගේ මුහුණ අතගෑවේ ය. ඌ තම ස්වාමියාගේ හිසත් අතත් ලෙව කෑවේ ය. බඳින ලද ගැටයකින් එක් කරන ලද දළ කෙස් වැටිය තෙල් ගා පීරනු ලැබූ කලක මෙන් ඔහුගේ හිස බදාගත්තේ ය.

"ඉතින් ඇති ......."

හඳයා යළිත් උපාලිස්ගේ පිටිඅල්ල ලෙව-කා අනතුරුව බැලුවේ ගෙයි උළුවස්ස දෙස ය.

දොර ඇරගෙන බරාඳයට පැමිණි උපාලිස්ගේ බිරිඳ,

"බැහැපන් බැහැපන් මිදුලට" කියමින් හඳයාගේ හිසට අත ගසා ඌ තල්ලු කළා ය. කීකරු දරුවකු මෙන් ඌ ආපසු හැරී මිදුලට බැස උපාලිස්ගේ ඇඳ දෙස මඳ වේලාවක් බලා සිට ගමන් කෙළේ ය.

ඌ මඳක් තැන් ගොස් හිස පස්සට හරවා ගස්සා 'කිස්' හඬින් වල්ගය ගැසුවේ ය. උගේ කොන්දෙහි හා පිටෙහි ඇලී සිටි කෝඳුරුවෝ, සුළඟින් නඟන ලද දූවිලි කඩක් මෙන් නැංගෝ ය.

"හඳයා මෙයාට නිදාගන්නවත් දෙන්නේ නැහැ; හැම දාම උදේ ඇවිත් අවදිකරනවා" බිරිඳ කීවා ය.

"දැන් වේලාව කීයට විතර ඇද්ද?"

"තාම කපුටන් හඬනවා. දැන් හයට විතර ඇති" යි කියමින් බිරිඳ වටපිට බැලුවා ය. නියන් කොබෙයියකු 'ක්කුවෝ ක්කුවෝ' යි නඟන හඬ ඈට ඇසෙයි. දෙතුන් වර්ගයක නළා හඬවන නළා කාරයන් මෙන් කුරුල්ලන් කිහිප දෙනකුන් නඟන මිහිරි හඬ ද ඈට ඇසෙයි.

"හඳයා හැම දාම උදේ ඇවිත් මෙයාගේ කකුල ලෙව කාලා මෙයා අවදි කරනවා. ඌ කාටවත් විකුණාදාන්න ඕනෑ ......."

"නෑ නෑ ඌ විකුණන්නේ නෑ" යි උපාලිස් කී ය.

- <u>වහල්ලු</u> යන මාතෘකා පාඨය මෙම ඡේදයට කෙසේ ගැළපේද යන්න පරීක්ෂා කරන්න.
- මෙම පාඨයෙහි මිනිසා සහ ගවයා අතර සම්බන්ධතාව ඉදිරිපත් කොට ඇති ආකාරය හා එහි වැදගත්කම පරීක්ෂා කරන්න.
- හැඟීම් දැනවීම සඳහා ලේඛකයා භාෂාව භාවිත කරන ආකාරය විමසන්න.
- මේ අවස්ථාව පිළිබඳව කවර හැඟීම් ඔබ තුළ ජනිත වේ ද?